ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය எனது இல. My No.	ඔබේ අංකය உமது இல. Your No.	දිනය திகதி Date 2026 . 10 . 12

පැමිණිලි පාර්ශවය	:	ආර්. එස්. ටී. ධර්මසිරි මහතා, නො. 261/ඩී, ගලඋඩ පාර, කොතලාවල, කඩුවෙල
වගඋත්තරකාර පාර්ශවය	:	සභාපති, ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාව
පැමිණිලි අංකය	**:**	**HRC/3566/24**

පැමිණිලි පාර්ශවයේ කරුණු දැක්වීම

රූපවාහිනි සංස්ථාවේ අභ්‍යන්තර විගණන නිලධාරීන් තෝරා ගැනීමේ පරීක්ෂණය 2024.07.25 වන දින පැවැති බවත් එම තනතුර සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් නොමැති සහ/හෝ සුදුසුකම් සම්පූර්ණ කර නොමැති නිලධාරීන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඇති බවත් එසේම අදාල උසස්වීම් ලබාදීම සඳහා දේශපාලන හා බාහිර පාර්ශවයන් විසින් මැදිහත් වීම් සිදු කරනු බැවින් නීතියට පටහැනිව ලබාදී ඇති අභ්‍යන්තර විගණන නිලධාරී තනතුරෙහි උසස්වීම් අවලංගු කර නැවත සම්මුඛ පරීක්ෂණය පවත්වන ලෙසට වගඋත්තරකරුවන්ට නියම කරන ලෙසට ඉල්ලා පැමිණිලිකරු විසින් 2024.09.03 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට මෙම පැමිණිල්ල ගොනු කර ඇත.

වගඋත්තරකාර ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ කරුණු දැක්වීම

පැමිණිල්ල සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාවේ සභාපතිගේ අංක රූවා 1/1/29 සහ 2024.10.14 දිනැති වාර්තාවක් ඉදිරිපත් කර ඇත. එසේම 2025.07.17 දින කොමිෂන් සභාවේ පැවැති පරීක්ෂණයට නියෝජ්‍ය අධ්‍යක්ෂ (නීති) එච්. එස්. සී. කුමාරි මහත්මිය විසින් ඉදිරිපත් කරනු ලැබූ කරුණු කෙරෙහිද අවධානය යොමු කරන ලදී.

පැමිණිල්ල සම්බන්ධව වගඋත්තරකාර රූපවාහිනි සංස්ථාව ප්‍රකාශ කර සිටින්නේ, පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ගොනු කර ඇති පැමිණිල්ලේ අයිතිවාසිකම් කඩ වූ දිනය ලෙස 2024.07.25 වන දින සඳහන් කර ඇති බවත් යම් තැනැත්තකගේ මූලික අයිතිවාසිකම් කඩවීමක් සිදු වුවහොත් එකී මූලික අයිතිවාසිකම් කඩු වූ දිනයේ සිට මාසයක් ඇතුළත අදාළ පැමිණිල්ල සිදුකළ යුතු වුවත් පැමිණිලිකාර ආර්ධර්මසිරි මහතා .ටී .එස් . විසින් සිය පැමිණිල්ල මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ගොනු කර ඇත්තේ 2024.09.03 වන දින බැවින් එදින වන විට ධර්මසිරි මහතාගේ මූලික අයිතිවාසිකම් කඩවීම සිදුවූයේ යැයි සඳහන් කර ඇති දින සිට මාසයක් ඉක්මවා ඇති බැවින් පැමිණිලිකරු විසින් සිය මූලික අයිතිවාසිකම් කඩවීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව ඉදිරියේ සිදු කර ඇති පැමිණිල්ල ඉදිරියට පවත්වාගෙන යාමේ හැකියාවක් නොමැති බවට මූලික විරෝධතාවයක් මතු කරමින් එම මූලික විරෝධතාවයට අගති රහිතව පැමිණිල්ල සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු ඉදිරිපත් කරන බවයි.

ප්‍රධාන කාර්යාලය பிரதான அலுவலகம் Head Office	අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 04. இல. 14, ஆர். ஏ. டி. மெல் மாவத்தை, கொழும்பு 04. No. 14, R. A. De Mel Mawatha, Colombo 04.	සභාපති தவிசாளர் Chairman	011 - 250 5451	ෆැක්ස් தொலைநகல் Fax	011 - 250 5541/74	ඊමේල් மின்னஞ்சல் E-mail	secretary@hrcsl.lk
දුරකථනය தொலைபேசி Telephone	94-11-250 5580 / 81 / 82	ලේකම් செயலாளர் Secretary	011 - 250 5521	ක්ෂණික துரித அழைப்பு Hotline	1996	වෙබ් இணையம் Web	www.hrcsl.lk

රූපවාහිනී සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය අනුව පැවති පුරප්පාඩු සඳහා අභ්‍යන්තර උසස් කිරීම් සිදුකිරීමට සංස්ථා මණ්ඩලය අනුමැතිය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව 2024.02.16 දිනැති මාණ්ඩලික නිවේදන අංක 1388 මගින් අභ්‍යන්තරයෙන් අයදුම්පත් කැඳවනු ලද බවත් එම මාණ්ඩලික නිවේදනය අනුව මෙම පැමිණිල්ලට අදාළ කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ (JM 1-1 වැටුප් කාණ්ඩයේ) අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර ඇතුළුව තනතුරු 16 ක් සඳහා අයදුම්පත් කැඳවන ලද බවයි. ඒ සඳහා පැමිණිලිකාර ආර් .ටී .එස් . **ධර්මසිරි මහතා ද අයදුම් කර තිබූ බවත් අංශ ප්‍රධානී රැස්වීමේ තීරණයක් අනුව පත් කරන ලද කමිටුවක් මගින් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අයදුම්කරුවන් තෝරා ගැනීම සිදු කරනු ලැබූ බවයි .**

එකී කමිටුව මගින් අයදුම්පත්‍ර අතරින් තෝරා ගන්නා ලද අයදුම්කරුවන් හය දෙනකු අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර සඳහා 2024.07.25 දින පැවැත්වූ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවා ඇති බවත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ලෙස සංස්ථා මණ්ඩලය අනුමැතිය සහිතව පත්කරන ලද සංස්ථා සභාපති/ අධ්‍යක්ෂ ජනරාල්, අමාත්‍යාංශ නියෝජිත, ප්‍රධාන ගණකාධිකාරී සහ අධ්‍යක්ෂ (පරිපාලන- වැ.බ.) යන අය සහභාගී වී ඇති අතර මීට අමතරව අභ්‍යන්තර විගණකවරයා ද සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයෙකු ලෙස නිරීක්ෂණ මට්ටමින් සහභාගී වී ඇති බවත් එම සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් 06 දෙනෙකු සහභාගී වී ඇති අතර සම්මුඛ පරීක්ෂණය අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව සිදුකර ඇති බවත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩල නිර්දේශය අනුව වැඩිම ලකුණු ලබාගත් වානිකා අංජලී ජයවර්ධන මහත්මිය සංස්ථා මණ්ඩල අනුමැතිය සහිතව JM 1-1 වැටුප් කාණ්ඩයේ අභ්‍යන්තර විගණන නිලධාරී තනතුරට පත් කර ඇති බවයි.

ඒ අනුව අභ්‍යන්තර විගණනක නිලධාරී තනතුරේ පුරප්පාඩු පිරවීමට අදාළව සංස්ථාවේ අනුමත බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව කටයුතු කර ඇති බැවින් එකී බඳවා ගැනීම සඳහා අභ්‍යන්තර අයදුම්පත් කැඳවා අභ්‍යන්තර විගණනක නිලධාරී තනතුරට සුදුස්සෙකු බඳවා ගැනීමට අදාළ ක්‍රියාවලිය අනුව අභ්‍යන්තර විගණනක නිලධාරී තනතුරට අයදුම් කළ කිසිදු නිලධාරියෙකුගේ මූලික අයිතිවාසිකම් කඩවීමක් සිදුවී නොමැති බවයි.

<u>නිරීක්ෂණ</u>

වගඋත්තරකාර ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපතිගේ අංක රූවා 1/1/29 සහ 2024.10.14 දිනැති වාර්තාව සඳහා පැමිණිලිකරු විසින් 2024.12.09 දිනැතිව නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත. ඒ අනුව වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිල්ලේ අයිතිවාසිකම් කඩවූ දිනය ලෙස 2024.07.25 දින සඳහන් කරමින් පැමිණිල්ල 2024.09.03 ගොනු කර ඇති බැවින් මූලික අයිතිවාසිකම් කඩවීම සිදුවිය යැයි සඳහන් කර ඇති දින සිට මාසයක් ඉක්මවා ඇති බැවින් තම අයිතිවාසිකම් කඩවීමෙන් මාසයක් ඇතුලත පැමිණිල්ල ගොනු නොකිරීම පිළිබඳව ගෙන ඇති මූලික විරෝධතාවය පිළිබඳව කරුණු පරීක්ෂා කර බැලීමේදී අදාළ සම්මුඛ පරීක්ෂණය 2024.07.25 වන දින පවත්වා ඇතිමුත් එම සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා ගන්නා ලද නිලධාරීන් කවුරුන්ද යන්න පිළිබඳව පැමිණිලිකරුට දැනගැනීමට ලැබී ඇත්තේ 2024.08.14 වන දින පත්වීම් ලිපි නිකුත් කරන ලද අවස්ථාවේදී වන බැවින් පැමිණිලිකරු 2024.09.03 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ල ගොනු කර ඇති බැවින් වගඋත්තරකරුගේ මූලික විරෝධතාවය බැහැර කල යුතු බව නිරීක්ෂණය කරයි. එසේම **ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ** සම්මත මෙහෙයුම් පටිපාටිය අනුව අයිතිවාසිකම් කඩවී මාස තුනක් ඇතුලත කොමිෂන් සභාව වෙත පැමිණිලි කළ හැකි බැවින්ද වගඋත්තරකාර ආයතනයේ මූලික විරෝධතාවය ප්‍රතික්ෂේප කර සිටී.

වගඋත්තරකාර රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ) ගේ අංක රූවා.1/1/29 සහ 2025.08.22 දිනැති ලිපිය මගින් සම්මුඛ පරීක්ෂණයේදී 1, 2 සහ 3 වන ස්ථානයන්ට ලකුණු ලබාගන්නා ලද අයදුම්කරුවන් විසින් යොමු කරන ලද අයදුම්පත්‍රය සහ ඒ සමඟ ඉදිරිපත් කරන ලද සහතික/ලේඛන සහ ඔවුන්ගේ රාජකාරි ලැයිස්තුව කොමිෂන් සභාවට යොමු කර ඇත. 2026.03.03 දිනැති ලිපිය මගින් සම්මුඛ පරීක්ෂණයේදී 4 සහ 5 වන ස්ථානයන්ට ලකුණු ලබා ගන්නා ලද අයදුම්කරුවන් අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර සඳහා යොමු කරන ලද අයදුම්පත්‍ර පමණක් කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම හේතුවෙන් ඒ පිළිබඳ කරන ලද විමසීමට 2026.05.27

දිනැතිව පිළිතුරු ලබාදෙමින් ඔවුන් අයදුම්පත්‍රය සමඟ ලේඛන ඉදිරිපත් කර නොමැති බැවින් සම්මුඛ පරීක්ෂණයේදී භාවිතා කිරීමට පෞද්ගලික ලිපිගොනුවේ තොරතුරු අනුව සකස්කරන ලද සුදුසුකම් උපලේඛනය සහ ඊට අදාළ සහතික පිටපත් ඉදිරිපත් කර ඇත.

වගඋත්තරකරුගේ උක්ත සමාංක සහ 2025.10.17 දිනැති ලිපිය මඟින් 2025.08.22 දිනැති ලිපියෙන් කොමිෂන් සභාව වෙත යොමු කරන ලද එම තොරතුරු පදනම් කරගනිමින් ලකුණු ලබාදීමේ ක්‍රමවේදය අනුව අතිරේක සුදුසුකම් හා වෙනත් ක්‍රියාකාරකම් සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලකුණු ලබාදී ඇති අතර, ඉදිරිපත් කරන ලද සහතික සඳහා වෙන් වෙන් වශයෙන් විස්තරාත්මකව ලකුණු ලබාදීම පිළිබඳ ලේඛනයක් නොමැති බව දන්වා ඇත.

ඒ අනුව ඉදිරිපත් වී ඇති සියලු කරුණු සලකා බැලීමෙන් පසුව වගඋත්තරකාර ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ අභ්‍යන්තර විගණනක නිලධාරී තනතුර සඳහා 2024.07.25 වන පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය වේ.

<u>මූලික සුදුසුකම්</u>

වගඋත්තරකාර රූපවාහිනී සංස්ථාවේ මාණ්ඩලික නිවේදන අංක 1388 සහ 2024.02.16 දිනැතිව සංස්ථා කාර්ය මණ්ඩලයේ JM 1-1 වැටුප් කාණ්ඩයේ තනතුරු 16 ක් සඳහා අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද සහිත ස්ථිර කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා ඇති අතර අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය අනුව සුදුසුකම් ලෙස පහත දක්වා ඇති සුදුසුකම් වලින් එකක් අවම වශයෙන් තිබිය යුතුය.

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගිණුම්කරණය, මූල්‍ය කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, ව්‍යාපාර කළමනාකරණය, වාණිජ්‍ය හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් උපාධියක් ලබා තිබීම

II. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වීම

III. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA 1- 2) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර සඳහා වූ යොමු කර ඇති අයදුම්පත්‍ර වලට අදාලව **අංශ ප්‍රධානී රැස්වීමේ තීරණයක් අනුව පත් කරන ලද කමිටුවක් මඟින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සම්මුඛ පරීක්ෂණය සඳහා** ආයතනයේ සේවකයන් 6 දෙනෙකු කැඳවා ඇති බවත් ඔවුන් සම්මුඛ පරීක්ෂණයේදී පහත වගුවේ සඳහන් පරිදි ලකුණු ලබා ගෙන ඇත.

	නම	අදාළ අතිරේක පළපුරුද්ද (ලකුණු 30)	අදාළ අතිරේක සුදුසුකම් (ලකුණු 30)	වෙනත් ක්‍රියාකාරකම් (ලකුණු 15)	සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය (ලකුණු 25)			ලබාගත් ලකුණු	ස්ථානය
					දැනුම (15)	ආකල්ප (05)	පෞරුෂත්වය (05)		
01	යූ.ජේ.අශෝක් ප්‍රනාන්දු	03	00	03	06	02	02	16	5
02	වානිකා අංජලී ජයවර්ධන	04	15	12	10	04	04	49	1
03	ආර්. සුරේෂ් තරංග ධර්මසිරි	04	13	09	12	03	03	44	3
04	එම් එන්. එම්. නව්රාස්	04	00	06	10	03	03	26	4
05	ජී. එච්. ඒ. එන්. හෙට්ටිආරච්චි	09	08	06	14	04	04	45	2
06	එම්. ආර්. එන්. කෞශලා	මූලික සුදුසුකම් සපුරා නොමැත							

එක් එක් අයදුම්කරුවන් බඳවා ගැනීමේ පරිපාටිය අනුව උක්ත සුදුසුකම් සපුරා ඇද්ද යන්න පිළිබඳ විමර්ශනය කිරීමේදී සම්මුඛ පරීක්ෂණයේ 1 සහ 3 වන ස්ථාන සඳහා ලකුණු ලබාගෙන ඇති වානිකා අංජලී ජයවර්ධන සහ පැමිණිලිකාර ආර්. සුරේෂ් තරංග ධර්මසිරි යන අය ඉහත සඳහන් කළ මූලික සුදුසුකම්හි I කාණ්ඩය යටතේ ඉල්ලුම් කර ඇති අතර ඔවුන්ගේ අයදුම්පත්‍රය අනුව එම සුදුසුකම් සම්පූර්ණ කර ඇති බව නිරීක්ෂණය වේ. එසේම පස්වන ස්ථානය ලබාගත් යූ.ජේ.අශෝක් ප්‍රනාන්දු යන අය ඉහත සඳහන් කළ මූලික සුදුසුකම්හි III කාණ්ඩය යටතේ එනම් කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA 1- 2) සේවා ශ්‍රේණියෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම යන නිර්ණායකය මත අයදුම් කර ඇත. අයදුම් කරන අවස්ථාව වනවිට ඔහු ජ්‍යෝෂ්ඨ ගිණුම් සහ අයකිරීම් සහකාර (MA 1- 2) සේවා ශ්‍රේණියෙහි I වන ශ්‍රේණියේ නිළධාරියෙකු බැවින් අභ්‍යන්තර විගණන නිලධාරී තනතුරට මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති බව නිරීක්ෂණය වේ.

එහෙත් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවා ඉන් ලකුණු 45 ක් ගෙන 2 වන ස්ථානයට පත්ව ඇති ජී. එච්. ඒ. එන්. හෙට්ටිආරච්චි සහ ලකුණු 26 ක් ලබා ගෙන 4 වන ස්ථානය ලබාගත් එම් එන්. එම්. නව්රාස් යන අය ඉහත සඳහන් කළ මූලික සුදුසුකම්හි II කාණ්ඩය යටතේ එනම් තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වීම යටතේ ඉල්ලුම් කර ඇත. එහෙත් 2 වන ස්ථානයට පත්ව ඇති ජී. එච්. ඒ. එන්. හෙට්ටිආරච්චි යන අය එකී II කාණ්ඩය වන පිළිගත් වරලත් ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සම්පූර්ණ කර නොමැති බව නිරීක්ෂණය කෙරේ. එසේම ඇය **ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය (AAT) අවසන් විභාගය සමත් වී ඇති බව සහතික පරීක්ෂාවේදී අනාවරණය වූ අතර එය** II කාණ්ඩය යටතේ ඉල්ලා සිටින පිළිගත් වරලත් ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය හා සමපාත වන වරලත් වෘත්තීය සුදුසුකමක් නොවන බැවින් අදාල මූලික සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව නිරීක්ෂණය වේ. එසේම 4 වන ස්ථානය ලබාගත් එම් එන්. එම්. නව්රාස් යන අය උසස් ජාතික ව්‍යාපාර පරිපාලන ඩිප්ලෝමා පාඨමාලාව හදාරා ඇති බවත් එහිදී ඔහු 2015.03.02 දින සිට 2015.09.01 දින දක්වා පවත්වන ලද in plant training වැඩසටහනක් සඳහාද සහභාගී වී ඇති බව නිරීක්ෂණය වේ. එහෙත් එම සුදුසුකම් ද ඉහත II කාණ්ඩය වන පිළිගත් වරලත් ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම ලෙසින් ඉල්ලා සිටින මූලික සුදුසුකම හා සමපාත නොවන බව නිරීක්ෂණය වේ.

ඒ අනුව 2 වන ස්ථානයට පත්ව ඇති ජී. එච්. ඒ. එන්. හෙට්ටිආරච්චි සහ 4 වන ස්ථානය ලබාගත් එම් එන්. එම්. නව්රාස් යන අය මෙම සම්මුඛ පරීක්ෂණ සඳහා මූලික සුදුසුකම් නොලබන බැවින් ඔවුන්ට ඉහත දක්වන ලද ලකුණු සඳහා හිමිකම් නොලබන බව වැඩිදුරටත් නිරීක්ෂණය කෙරේ.

අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර සඳහා වූ යොමු කර ඇති අයදුම්පත්‍ර වලට අදාලව **සුදුසුකම් පරීක්ෂා කිරීමට පත් කරන ලද කමිටුවක් මඟින් සුදුසුකම් පවතින බවට තෝරාගෙන සම්මුඛ පරීක්ෂණයට කැඳවූ** එම්. ආර්. එන්. කෞශල්‍යා යන අයගේ නම ඉදිරියෙන් මූලික සුදුසුකම් නොමැති බව සටහන් කර ඇති බව 2024.07.25 වන දින පැවැති සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලේඛනය පරීක්ෂාවේදී අනාවරණය වේ.

ඉහත කරුණු අනුව, කමිටුව මඟින් සම්මුඛ පරීක්ෂණය සඳහා යොමු කරන ලද නිලධාරීන් 6 දෙනාගෙන් 3 දෙනෙකුම මූලික සුදුසුකම් නොමැති අය බව නිරීක්ෂණය වන අතර එහෙත් මූලික සුදුසුකම් නොමැති බවට ඉහතින් සඳහන් කරන ලද එච්. ඒ. එන්. හෙට්ටිආරච්චි සහ එම් එන්. එම්. නව්රාස් යන අය සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලකුණු ලබා දී ඇති බවද සම්මුඛ පරීක්ෂණ ලකුණු සටහන අනුව පෙනීයන අතර සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයන් ලෙස ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපති, ප්‍රධාන ගණකාධිකාරී, අධ්‍යක්ෂ(පරිපාලන) සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සැලසුම්) යන අය සහභාගීව සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලේඛනයට අත්සන් තබා ඇත.

එබැවින්, අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර සඳහා වූ මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති වානිකා අංජලී ජයවර්ධන, පැමිණිලිකාර ආර්. සුරේෂ් තරංග ධර්මසිරි සහ යූ.ජේ.අශෝක් ප්‍රනාන්දු

යන අය සම්බන්ධයෙන් පමණක් සම්මුඛ පරීක්ෂණයේදී එක් එක් කාණ්ඩ යටතේ ලකුණු ලබා දී ඇති අකාරය පිළිබඳ අවධානය යොමු කෙරේ.

අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයේදී අදාල අතිරේක පළපුරුද්ද, අතිරේක සුදුසුකම් යන නිර්ණායක සඳහා එක් එක් නිර්ණායක සඳහා ලකුණු 30 බැගින් ද වෙනත් ක්‍රියාකාරකම් සඳහා ලකුණු 15 බැගින් ද, සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව සඳහා ලකුණු 25 ලෙසින්ද අයදුම්කරුවන් හට ලබා දී ඇති අතර "*අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර සඳහා ලකුණු ලබාදීමේ ක්‍රමවේදය*" නැමැති ලේඛනයකට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් අත්සන් කර ඇත. ඒ අනුව එක් එක් නිර්ණායක යටතේ වෙන් කර ඇති මුළු ලකුණු උප නිර්ණායක යටතේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් බෙදා ඇති බව නිරීක්ෂණය වේ.

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය එම ලේඛනය අනුව ලකුණු ලබා දී ඇති බවට වගඋත්තරකාර පාර්ශවය කරුණු දැක්වූවද එම ලේඛනය තුලින් එක් එක් නිර්ණායක යටතේ ලකුණු ලබාදීමේදී සලකා බලන කරුණු මොනවාද යන්න හෝ කුමන පදනමකින් ලකුණු වෙන්කර ලබා දුන්නේද යන්න විශ්ලේෂණාත්මකව සඳහන් කර නොතිබීම හේතුවෙන් ඒ පිළිබඳව වගඋත්තරකාර ආයතනයෙන් විමසීමක් කලද සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදුන් ආකාරය පිළිබඳව විස්තර නොමැති බවට වගඋත්තරකාර රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ) ගේ අංක රූවා.1/1/29 සහ 2025.10.17 දිනැති ලිඛිතව පිළිතුරු ලබා දී ඇත.

<u>අතිරේක පළපුරුද්ද</u>

වගඋත්තරකාර ආයතනය විසින් ඉදිරිපත් කර ඇති අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර සඳහා ලකුණු ලබාදීමේ ක්‍රමවේදය අනුව, අදාල අතිරේක පළපුරුද්දට ලකුණු 30 ක් වෙන් කර ඇති අතර එය වසරකට 01 ලකුණ බැගින් ලබාදෙන බව දක්වා ඇත.

ඒ අනුව, සේවා පළපුරුද්ද යටතේ අයදුම් කරන ලද යූ.ජේ.අශෝක් ප්‍රනාන්දු යන අය 2020.07.01 දින සිට ජ්‍යෙෂ්ඨ ගිණුම් සහ අයකිරීම් සහකාර (MA 1- 2) සේවා ගණයෙහි I වන ශ්‍රේණියේ නිලධාරියෙකු ලෙස අභ්‍යන්තර විගණන නිලධාරී තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය තුල ආයතනයේ රාජකාරි කරන අයෙකු වේ. මෙම කාණ්ඩය යටතේ මොහුට ලකුණු 03 ක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ලබා දී ඇති බව නිරීක්ෂණය වේ. එහෙත් ඔහු සම්බන්ධව සලකා බලන මූලික සුදුසුකම වන කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA 1- 2) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව එළඹෙන වර්ෂයන් සඳහා ඔහුට ලකුණු හිමි විය යුතු බව නිරීක්ෂණය කරන අතර වගඋත්තරකාර ආයතනය පෞද්ගලික ලිපිගොනුව ආශ්‍රයෙන් පිළියෙළ කර ඇති ලේඛනය තුල ඔහු II වන ශ්‍රේණියට පත්වීම් ලද්දේ කවරදාක සිට ද යන්න දක්වා නොමැත. එබැවින් ඔහුට හිමිවිය යුතු ලකුණු ප්‍රමාණය නිශ්චිතව දැක්වීමට තොරතුරු ප්‍රමාණවත් නොවේ.

කෙසේ වෙතත් පැමිණිලිකරු සහ අභ්‍යන්තර විගණන තනතුර සඳහා තෝරා ගෙන ඇති අයගේ අයදුම්පත් පරීක්ෂා කිරීමේදී දෙදෙනාම කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA 1- 2) සේවා ගණයෙහි III වන ශ්‍රේණියේ තනතුරක සේවය කරන බව නිරීක්ෂණය වන අතර අයදුම්කරුවන් දෙදෙනාටම ලකුණු 04 ක් ලබා දී ඇති බව පෙනී යයි.

<u>අතිරේක සුදුසුකම්</u>

අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර සඳහා ලකුණු ලබාදීමේ ක්‍රමවේදය අනුව අතිරේක සුදුසුකම් සඳහා ලකුණු 30 ක් ලබා දෙන අතර එය <u>අධ්‍යාපන</u> සහ <u>වෘත්තීය</u> ලෙස කොටස් දෙකක් යටතේ ලකුණු ලබා දීම සිදු කරන බව නිරීක්ෂණය වේ

i. <u>අධ්‍යාපන කාණ්ඩය</u>
   ලකුණු 10 ක් උපාධියක් සඳහා ලබාදෙන බව දක්වා ඇත.

ඒ අනුව අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර සඳහා තෝරා ගෙන ඇති අය වානිකා අංජලී ජයවර්ධන සහ පැමිණිලිකරු මෙම තනතුරට අයදුම්පත් යොමු කිරීමේදී මූලික සුදුසුකම් සලකා බැලූ උපාධියට අමතර වෙනත් උපාධියක් ලබා නොමැත. එසේම යූ.ජේ.අශෝක් ප්‍රනාන්දු යන

අයටද උපාධි සුදුසුකමක් නොමැති බැවින් අධ්‍යාපන කාණ්ඩය යටතේ ලකුණු ලබා ගැනීම සඳහා හිමිකම් නොලබන බව පෙනීයයි.

එසේම මෙම නිර්ණායකය යටතේ ලකුණු 10 ක් උපාධියක් සඳහා පමණක් සීමා කර ඇති අතර යම් අයදුම්කරුවෙකු සතුව පශ්චාත් උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් තිබුණහොත් ඒ සඳහා ලකුණු ලබාදීමේ ක්‍රමවේදයක් උක්ත ක්‍රමවේදය තුළ නොමැති බව පෙනී යයි.

ii. <u>වෘත්තීය කාණ්ඩය</u>

ලකුණු 20 පහත සුදුසුකම් යටතේ ලකුණු ලබාදෙන බවට දක්වා ඇත.

ඩිප්ලෝමා - වසරක කාලයකට වැඩි (ලකුණු 07)
ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පාඨමාලාව ලකුණු (05)
පරිගණක පාඨමාලාව ලකුණු (05)
ක්ෂේත්‍රයට අදාළ පුහුණු පාඨමාලාව ලකුණු (03)

සම්මුඛ පරීක්ෂණයේදී අභ්‍යන්තර විගණන තනතුර සඳහා තෝරා ගෙන ඇති අය වානිකා අංජලී ජයවර්ධන මහත්මිය සඳහා ලකුණු 15 ක් ද, පැමිණිලිකරුට ලකුණු 13 ක්ද ලබා දී ඇති බව නිරීක්ෂණය වේ.

වගඋත්තරකරු මෙම නිර්ණායක යටතේ ලකුණු ලබාදුන් ආකාරය පිළිබඳව තොරතුරු ලබාදීමට අසමත් වී ඇත. එහෙත් අභ්‍යන්තර විගණන තනතුර සඳහා තෝරා ගෙන ඇති වානිකා අංජලී ජයවර්ධන මහත්මිය ඉදිරිපත් කර ඇති Diploma in Professional Human Resource Management සඳහා ලකුණු 07 ක්ද, Certificate of Computer Application සඳහා ලකුණු 05 ක් සහ Diploma in Computerized Accounting සඳහා ලකුණු 03 ක් ලෙසින් මුළු ලකුණු 15 ක් වෘත්තීය කාණ්ඩය යටතේ ලබා දී ඇති බව නිරීක්ෂණය කරන අතර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඇයට නිසි පරිදි ලකුණු ලබාදීමක් සිදු කර ඇත. පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති Computer Diploma සඳහා ලකුණු 05ක්ද, English Language Course සඳහා ලකුණු 05 ක්ද ලබාදිය යුතු අතර ඔහුට ලබා දී ඇති මුළු ලකුණු සංඛාව 13 වන බැවින් ඉතිරි ලකුණු 03 පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති AAT qualified සඳහා ලකුණු පිරිනමා ඇති බවට කොමිෂන් සභාව උපකල්පනය කරයි.

කෙසේ වෙතත් පැමිණිලිකරු ඉදිරිපත් කර ඇති ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය (AAT) අවසන් විභාගය සමත් අයවලුන් එම පාඨමාලාව වසරකට වඩා වැඩි කාලසීමාවක් පැවැත්වෙන පාඨමාලාවක් වන බැවින් හා පොදුවේ ඩිප්ලෝමාවකට සමාන ඇගයීමක් පවතින අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර සඳහා ඉදුරාම අදාල වන පාඨමාලාවක් බැවින් ද, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ පදනම් පාඨමාලාවෙන්ද නිදහස් කිරීම ලබා ගැනීමට හේතුවන පාඨමාලාවක්ද බැවින් මෙම පාඨමාලාවට ඉහළ බරතැබීමක් කල යුතු පාඨමාලාවක් ලෙස කොමිෂන් සභාව නිරීක්ෂණය කරන බැවින් පැමිණිලිකරුට AAT qualified සඳහා ලකුණු 7 ක් ලැබිය යුතුවන අතර ඒ අනුව, මෙම කාණ්ඩය යටතේ පැමිණිලිකරුට මුළු ලකුණු 17 ක් හිමිවිය යුතුවේ.

වෘත්තීය සුදුසුකම් සඳහා ලකුණු 20 ක් බෙදා ඇති අතර එය ඉහත සඳහන් කර ඇති පරිදි උප නිර්ණායක වලට බෙදා ලකුණු ලබා දී ඇත. එහෙත් එම උප නිර්ණායක වලදී වසරක කාලයකට වැඩි ඩිප්ලෝමා සඳහා ලකුණු 07 වෙන්කර ඇති අතර එය කුමන ක්ෂේත්‍රයකට අදාල ඩිප්ලෝමාව පාඨමාලාද යන්න සඳහන් නොකර ඇති බැවින් පොදුවේ වසරක කාලයක් ඉක්මවන ඕනෑම පාඨමාලාවක් සඳහා මෙම ලකුණු ලබා දීමේ හැකියාව පවතින බව පෙනේ. ඒ අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලකුණු ලබාදීමේ ක්‍රමවේදය යටතේ මෙම නිර්ණායකය සඳහා ලකුණු ලබාදීමේ සිදු කරන ලද උප නිර්ණායන වඩා ප්‍රායෝගික සහ විනිවිදභාවයකින් සිදු කර ඇති ද යන්න ගැටළු සහගත වේ.

<u>වෙනත් ක්‍රියාකාරකම්</u>

මෙම නිර්ණායකය සඳහා මුළු ලකුණු 15 ක් ලබාදීමට නියමිත අතර එම ලකුණු නිර්මාණශීලී කටයුතු/ වෙනත් භාෂා හැසිරවීමට ඇති හැකියාව/ කණ්ඩායම් හැඟීමෙන් සිදු කල කටයුතු/

නායකත්ව හැකියාවන් ඉස්මතු කල කටයුතු යන අනු නිර්ණායක මත පදනම්ව ලබාදී ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව, අභ්‍යන්තර විගණන තනතුර සඳහා තෝරා ගෙන ඇති අය සඳහා ලකුණු 12 ක් ද, පැමිණිලිකරුට ලකුණු 09 ක් සහ යු.ජේ.අශෝක් ප්‍රනාන්දු යන අයට ලකුණු 03 ක් ලබා දී ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව, සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින තෙක් මෙම නිර්ණායකය යටතේ ලකුණු ලබාදෙන උප නිර්ණායක පිළිබඳව අයදුම්කරුවන්ද දැනුවත්ව සිටි බවක් නිරීක්ෂණය නොවන අතර එසේම වගඋත්තරකාර ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ) ගේ අංක රුවා.1/1/29 සහ 2025.10.17 දිනැති ලිපිය මඟින් ඉහත කරුණු යටතේ ලකුණු ලබාදීම සිදු කරන බව දන්වා සිටියද ඉහත අයදුම්කරුවන් සඳහා ලකුණු ලබාදීමේ නිශ්චිත පදනම පැහැදිලි කිරීමට වගඋත්තරකරු අපොහොසත් වී ඇත.

පැමිණිලිකරුගේ අයදුම්පතෙහි වෙනත් කරුණු යටතේ ජනසතු සේවා ක්‍රිකට් තරඟාවලියේ ජයග්‍රාහණය කිරීමට නායකත්වය ලබාදීම දක්වා ඇත. තවද ඔහු විසින් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති ලේඛන අනුව 2013 වසරේ මාර්තු සහ අප්‍රේල් මාස සඳහා වගඋත්තරකාර ආයතනයේ තමා සේවය කරන අලෙවි අංශයේ මිලියන 200ක වාර්තා ගත මාසික අලෙවි ආදායමක් ලබාගැනීම උදෙසා දැක්වූ දායකත්වය සහ කැපවීම අරභයා ඇගයීම් සහතික සඳහා හිමිකම් පා ඇති බව නිරීක්ෂණය වේ. එසේම මෙම අභ්‍යන්තර විගණන තනතුර සඳහා තෝරා පත් කර ගන්නා ලද චානිකා අංජලී ජයවර්ධන මහත්මියගේ අයදුම්පත්‍රයේ AIBD 44th Annual Gathering & Conference (සංවිධාන කටයුතු) වෙනුවෙන් ඇගයීම් සහතිකයක්ද, අධ්‍යක්ෂ ජනරාල් අජිත් නාරංගල මහතා විසින් සිදු කරන ලද සේවා ඇගයීම දක්වා ඇත. එහෙත් වගඋත්තරකරු මෙම කාණ්ඩය යටතේ ලකුණු ලබාදුන් ආකාරය තහවුරු කිරීමට අසමත්ව ඇති බැවින් අයදුම්පත්‍රයන් හි සඳහන් කර ඇති තොරතුරු සහ ඊට පරිබාහිර තොරතුරු සඳහා ලකුණු ලබාදී ඇද්ද යන්න නිර්ණය කිරීමට අපහසු වේ.

ඒ අනුව, සම්මුඛ පරීක්ෂණයට පෙර මෙම නිර්ණායක යටතේ ලකුණු ලබාදෙන ආකාරය පිළිබඳ දැනුවත් කර නොමැති බවත් ලබාදුන් ලකුණු කුමන ක්‍රියාකාරකමක් සඳහා ලබා දී ඇද්ද යන්න වගඋත්තරකරු තහවුරු කිරීමට අසමත්ව ඇති බැවින්ද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඔවුන්ගේ අභිමතය විනිවිදභාවයකින් තොරව ලකුණු ලබාදී ඇති බැවින් ද සම්මුඛ පරීක්ෂණ ක්‍රියාදාමය විධිමත් හා පටිපාටියට අනුකූල නොවන බව ද නිරීක්ෂණය වේ.

<u>සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා</u>

සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලාතා සඳහා මුළු ලකුණු 25 ක් වෙන් කර ඇති අතර එය දැනුම සඳහා ලකුණු 15 ක් ද, ආකල්ප සඳහා ලකුණු 05 සහ පෞර්ෂත්වය සඳහා ලකුණු 05 ක් ලෙසින් උප නිර්ණායක සඳහා වෙන් කර ඇත.

අභ්‍යන්තර විගණන තනතුර සඳහා තෝරා ගන්නා ලද චානිකා අංජලී ජයවර්ධන මහත්මිය සහ පැමිණිලිකරු යන දෙදෙනාටම ලකුණු 18 බැගින් ද යු.ජේ.අශෝක් ප්‍රනාන්දු යන අයට ලකුණු 10 ක් ලබා දී ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු 2024.07.25 වන දින උපලේඛන නිලධාරී තනතුර සඳහා පැවැති සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි බැවින් පෙර පරීක්ෂණයට සහභාගී වූ නිසා තමා ගැන දන්නා බැවින් ඒ අනුව ලකුණු ලබාදෙන බව පවසා තමා සම්මුඛ පරීක්ෂණයට ලක් නොකළ බවට කරුණු දක්වා තිබුණද එම තනතුරු දෙකක සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩල දෙකක් බව නිරීක්ෂණය වේ.

කෙසේ වෙතත් යම් අයදුම්කරුවෙක් සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන අකාරය සහ එම අවස්ථාවේ දී ඔහු දක්වන කුලසතාවය මත එම ලකුණු ලබාදෙන බැවින් එය පසු අවස්ථාවකදී පරීක්ෂණයට භාජනය කළ නොහැකි කරුණුක්ද බැවින් මෙම කාණ්ඩය යටතේ ලබාදී ඇති ලකුණු සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව නිගමනයකට පැමිණීමට අපේක්ෂා නොකරයි.

<u>නිගමනය</u>

වගඋත්තරකාර සභාපතිගේ අත්සනින් යුතුව 2024.02.16 දිනැති මාණ්ඩලික නිවේදන අංක 138 මගින් කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ (JM 1-1 වැටුප් කාණ්ඩයේ) අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර ඇතුළු තනතුරු 16 ක් සඳහා අයදුම්පත් කැඳවා ඇත. ඒ අනුව, අංශ ප්‍රධානී රැස්වීමේ තීරණයක් අනුව පත් කරන ලද කමිටුවක් මගින් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අයදුම්කරුවන් තෝරා ගැනීම සිදු කර සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් 06 දෙනෙකු යොමු කර ඇති බව නිරීක්ෂණය වේ. එම අයදුම්කරුවන් 06 දෙනා අතරින් එක් අයකු මූලික සුදුසුකම් සපුරා නොමැති බවට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කර ඇත. එසේම සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ 06 දෙනාගෙන් 03 දෙනෙකු ඒ සඳහා මූලික සුදුසුකම් නොමැති බව කොමිෂන් සභාව විසින් ඉහතින් දක්වා ඇති කරුණු අනුව නිරීක්ෂණය වේ.

වගඋත්තරකාර ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2024.08.06 දිනැති තීරණ අංක 908.02.0 යටතේ JM 1-1 වැටුප් කාණ්ඩය යටතේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සඳහා වගඋත්තරකාර ආයතනයේ සභාපති/ අධ්‍යක්ෂ ජනරාල්, රේඛීය අමාත්‍යාංශ නියෝජිතයෙක්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු), අධ්‍යක්ෂ (පරිපාලන) සහ අදාල අංශ ප්‍රධානියා ලෙසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සඳහා අනුමැතිය ලබා දී ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව, අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර සඳහා ඉහත සංයුතිය යටතේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සාමාජිකයින් 4 දෙනෙකුගෙන් සමන්විත වී ඇත. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ 06 දෙනා අතරින් එක් අයකු පමණක් මූලික සුදුසුකම් නොමැති අයකු ලෙසට හඳුනාගෙන ඇත. එහෙත් කොමිෂන් සභාවේ ඉහත නිරීක්ෂණ අනුව මූලික සුදුසුකම් සපුරා නොමැති එහෙත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලකුණු ලබා දී ඇති තවත් දෙදෙනෙකු සිටින බව නිරීක්ෂණය වී ඇති බැවින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය නිසි පරිදි අයදුම්කරුවන් විධිමත් පරීක්ෂාවකට ලක්කර තිබේද යන්න ගැටළු සහගතවේ.

එසේම බඳවා ගැනීමේ පරිපාටිය අනුව සම්මුඛ පරීක්ෂණයේදී අදාල අතිරේක පළපුරුද්ද, අතිරේක සුදුසුකම් යන කාණ්ඩ සඳහා එක් එක් කාණ්ඩය සඳහා ලකුණු 30 බැගින් ද වෙනත් ක්‍රියාකාරකම් සඳහා ලකුණු 15 බැගින් ද සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා සඳහා ලකුණු 25 බැගින් අයදුම්කරුවන් හට පිරිනමා ඇති අතර *"අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර සඳහා ලකුණු ලබාදීමේ ක්‍රමවේදය"* නැමැති ලේඛනයකට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් අත්සන් කර ඇත. සම්මුඛ පරීක්ෂණයට පෙර අදාළ ලකුණු ලබාදීමේ පරිපාටිය උප නිර්ණායකද ඇතුලත්ව ප්‍රසිද්ධ කිරීමට කටයුතු කර නොමැති අතර සම්මුඛ පරීක්ෂණයේදී එක් එක් නිර්ණායක යටතේ එක් එක් අයදුම්කරු වෙත ලකුණු ලබාදී ඇති සුදුසුකම් කවරේද යන්න ඉදිරිපත් කිරීමට වගඋත්තරකාර රූපවාහිනී සංස්ථාව අපොහොසත් වීම මත එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේදී ලකුණු ලබාදීමේ ක්‍රියාදාමයම දෝෂ සහගත සහ විධිමත්භාවයෙන් තොරව සිදුවූවක් බව පෙනී යයි. ඒ හේතුවෙන් එකී සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින ලද සියලුම අයදුම්කරුවන්ගේ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර ඇති *"නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද, නීතියේ රැකවරණයද, සර්ව සාධාරණ විය යුත්තේය"* යන්න සහ යන මූලික අයිතිවාසිකම් වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝනය කර ඇති බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබේ.

එකී නිගමනය ප්‍රකාරව මෙම වගඋත්තරකරු සම්බන්ධයෙන් පහත නිර්දේශ නිකුත් කරනු ලැබේ.

නිර්දේශ :

වගඋත්තරකාර රූපවාහිනී සංස්ථාව විසින්,

1. වගඋත්තරකාර ආයතනය තුළ පුරප්පාඩු පිරවීමේදී, ඉදිරි සම්මුඛ පරීක්ෂණ වලදී ලකුණු ලබාදීමේ නිර්ණායකයන් පැහැදිලි හා නිවැරදිව දක්වමින් ඒ සඳහා ලකුණු ලබාදීමේ ක්‍රමවේදයක් ඇතුළත් පැහැදිලි නිර්ණායක දක්වන උපදෙස් මාලාවක් ඇතුළත් කරමින් සම්මුඛ

පරීක්ෂණයේ ලකුණු ලබාදීමේ පරිපාටිය විධිමත් පරිදි අනුමත කර ගැනීමට සහ සම්මුඛ පරීක්ෂණයට පෙර එම ලකුණු ලබාදීමේ පරිපාටිය ප්‍රසිද්ධ කිරීමට පියවර ගත යුතු ය. ඒ අනුව, අදාළ ලකුණු දීමේ ක්‍රමවේදය සකස් කොට එහි පිටපතක් කොමිෂන් සභාව වෙත ලැබීමට සැලැස්විය යුතු වේ.

ලේකම්, ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින්,

2. නිරීක්ෂිත කරුණු අනුව, පැමිණිලිකරු වෙත අදාළ අතිරේක සුදුසුකම් සඳහා මුළු ලකුණු 17 හිමිවිය යුතු අතර ඒ අනුව ඔහුගේ මුළු ලකුණු ලකුණු 48 ක් වන බවත් එහෙත් අභ්‍යන්තර විගණන තනතුර සඳහා තෝරා ගන්නා ලද චානිකා අංජලී ජයවර්ධන මහත්මිය ලකුණු ප්‍රමාණයට වඩා ලකුණු එකක් අඩු බව නිරීක්ෂණය වේ. එහෙත් වෙනත් ක්‍රියාකාරම් සඳහා ලබාදී ඇති පදනම් හෙළි කිරීමට වගඋත්තරකරු අපොහොසත් වී ඇති බැවින් පැමිණිලිකරුට ලැබිය යුතු ලකුණු ප්‍රමාණයක් නොලැබී ඇත්ද යන්න ගණනය කිරීමේ හැකියාවක් නොමැත. එය පැමිණිලිකරු කෙරෙහි අගතිගාමී ලෙස බලපා තිබේද යන්න ප්‍රශ්නගතය. මේ නිසා මේ පිළිබඳව පරීක්ෂා කර සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට නිර්දේශ කරමු.

3. ඉදිරියේ පවත්වන සම්මුඛ පරීක්ෂණ වඩා විනිවිදභාවයෙන් යුතුව සිදු කරන ලෙසට වගඋත්තරකාර පාර්ශවය වෙත අවශ්‍ය උපදෙස් ලබාදීමට කටයුතු කරන ලෙස නිර්දේශ කරමු.

2026. ...11.......26...... වන දිනට පෙර වගඋත්තරකරු විසින් ඉහත නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්ති ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාර පාර්ශවය විසින් ද කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වේ.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :- 01. අමාත්‍යතුමා,
ජනමාධ්‍ය අමාත්‍යාංශය,
නො. 163, ඇසිදිසි හවුස්, කිරුළපන මාවත,

පොල්හේන්ගොඩ, කොළඹ 05

02. ලේකම්,
ජනමාධ්‍ය අමාත්‍යාංශය,
නො. 163, ඇසිදිසි හවුස්, කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

- ඉහත නිර්දේශ ප්‍රකාරව පියවර ගැනීමට.